# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2442/65 - 2025 ජුනි මස 28 වැනි සෙනසුරාදා - 2025.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KOT/LND/ACQVI/01/84.
*කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/18/2020/WS/179.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තරය*:-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 243 දෙනියාය ග්‍රාම නිලධාරි වසමේ මතුගොබේ (දැනට දෙනියාය) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 820621 හි කලාප අංක 05හි පත්‍ර අංක 1 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0475 ක් වූ දෙමලියදොලවත්ත නමැති පහත සඳහන් ඉඩම් කැබලිවලට මායිම් වන ඉඩම් කොටස.

01. **කැබලි අංක 1 - දෙමලියදොලවත්ත නමැති ඉඩම, ඉඩමේ අයිතිය: හරිලාල් ජයන්ත රංචිගොඩ විජේසේකර, සමන්පාය, උඩ බංගලාව, දෙනියාය - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0469.**

*උතුරට*: ප්‍රාදේශීය සභා මාර්ගය සහ අ.ග.පි. 169හි කැබලි අංක 87; *නැගෙනහිරට*: අ.ග.පි. 169 කැබලි අංක 87; *දකුණට*: කැබලි අංක 2 සහ අ.ග.පි. 169 කැබලි අංක 87; *බටහිරට*: මාර්ගය සහ අ.ග.පි. 169 හි කැබලි අංක 87.

02. **කැබලි අංක 2 - දෙමලියදොලවත්ත නමැති ඉඩම, ඉඩමේ අයිතිය: හරිලාල් ජයන්ත රංචිගොඩ විජේසේකර, සමන්පාය, උඩ බංගලාව, දෙනියාය - ප්‍රමාණය: හෙක්ටයාර් 0.0006.**

*උතුරට*: කැබලි අංක 1; *නැගෙනහිරට*: අ.ග.පි. 169 කැබලි අංක 87; *දකුණට*: අ.ග.පි. 169 කැබලි අංක 87; *බටහිරට*: මාර්ගය සහ කැබලි අංක 01.

ඉහත සඳහන් ඉඩම හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ජූලි මස 28 වැනි දින පෙ.ව. 10.00 ට කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2025 ජූලි මස 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, ඉකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

**දම්සර කරුණාජීව ලන්දගේ,**
ප්‍රාදේශීය ලේකම්,
කොටපොල.

2025 ජුනි මස 16 වැනි දින,
කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0288




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: KDS/KGK/4/2(1)/2020/05/12/18.
*ඉඩම් හා සංචාරක අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/7/2020/HW/202.

උක්ත ශීර්ෂ යටතේ 2022 නොවැම්බර් මස 09 වැනි දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2305/13 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද දැන්වීමෙහි සඳහන් මෙහි පහත I ඡේදයේ* දැක්වෙන ඉඩම් කොටස වෙනුවට මෙහි II ඡේදයේ දැක්වෙන ඉඩම් කොටස් ආදේශ කර එම දැන්වීම සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**I ඡේදය**
මු.පි.මහ 7168 හි,
කැබලි අංක 37
ඉහත සඳහන් ඉඩම් කොටස පහත පරිදි සංශෝධනය විය යුතුය.

**II ඡේදය**
ආදේශ කළ යුතු කොටස්
කැ සි 320433/02/1 හි,

**කැබලි අංක 1**
ඉඩමේ නම: වහලවෙල, වරිපනම් අංක 879, විලියම් ගොපල්ලව මාවත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක. විදාන බහිදිගේ ප්‍රෙස්ලි ජයවීර අයිතිවාසිකම් කියයි; ප්‍රමාණය: හෙක්. 0.0013.

**කැබලි අංක 2**
ඉඩමේ නම: වහලවෙල, වරිපනම් අංක 879A, විලියම් ගොපල්ලව මාවත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක, වතමන ආරච්චිලාගේ කිංස්ලි පෙරේරා අයිතිවාසිකම් කියයි; ප්‍රමාණය: හෙක්. 0.0010.

**එච්. එම්. එම්. යූ. බී. හේරත්,**
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළය.

2025 ජුනි මස 18 වැනි දින,
මහනුවර කඩවත්සතර හා ගඟවට කෝරළය,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 06 - 0289

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.